සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 6 - 2019

නම : ............................................... චිත්‍ර කලාව කාලය : පැය 02 යි.

සැළකිය යුතුයි :

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය.
  I - කොටස ලිඛිත ප්‍රශ්න 20ක් යුක්ත වේ.
  II - කොටස ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රයකි. කොටස් දෙකකට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- **I පත්‍රයේ සියළුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.**

---

## I කොටස




- **අංක 01 සිට 05 ක්වා ප්‍රශ්නවලට ඉහත දැක්වෙන රූප සටහන ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.**

(1) ඉහත දැක්වෙන රූප සටහන කුමක් ද? ..........................................................................................

(2) C අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක් ද? ..........................................................................................

(3) D අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක් ද? ..........................................................................................

(4) බොරැල්ලේ සියලු සාන්තුවරයින්ගේ දේවස්ථානය අයත් වන්නේ කුමන වර්ගයකට ද? ..................................................
..........................................................................................

(5) එහි චිත්‍ර ඇඳීම සඳහා භාවිතයට ගන්නා වීදුරු වර්ගය හඳුන්වන නම කුමක් ද?..................................................
..........................................................................................

I **අංක 06 සිට 10 දක්වා වාක්‍යවලට පහත දැක්වෙන වචන භාවිතයට ගෙන හිස්තැන් පුරවන්න.**

(හර්මිකාව, වකදෙක, හැඩතල, දියසායම්, කොලාජ්)

(6) චිත්‍රයක් රේඛා ............................................................................................ වර්ණවලින් සමන්විත වේ.

(7) සාංචි ස්තූපයෙහි මුදුනෙහි ඇති ශෛලමය ගරාඩි වැට ......................................................................... නමින් හඳුන්වයි.

(8) පිරිසිදු ජලය අඩුවැඩි කරමින් ............................................................................. මාධ්‍යය භාවිතා කරමින් අලංකාර චිත්‍ර නිර්මාණය කළ හැකිය.

(9) පැරණි චිත්‍ර ශිල්පීන් තම ගෝලයින්ට ඇඳීම පුහුණු කිරීම සඳහා .............................................................................. නමැති අභ්‍යාසය ලබාදේ.

(10) වර්ණ කඩදාසි ඉරා ඇලවීමෙන් ............................................................................. චිත්‍ර නර්මාණය කළ හැකිය.

I **අංක 11 සිට 15 දක්වා පහත දී ඇති කියමන් හරිනම් (3) ලකුණ ද වැරදි නම් (6) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

(11) තෙමඟුල සිහි ගන්වමින් හින්දු බැතිමතුන් වෙසක් පොහොය මහත් හරසරින් සමරති. (...............)

(12) සදාත් හා සකදාත් දානමය කටයුත්ත සිදුකරන්නේ ඉස්ලාමීය බැතිමතුන්ය. (...............)

(13) හින්දු ආගමික සංකේතය ලෙස භාවිතා කරන්නේ වෘෂභ කොඩියයි. (...............)

(14) කළුගල් මාධ්‍ය යොදා ගනිමින් නිර්මාණය කරන ලද කිසිදු මූර්තියක් හෝ කැටයමක් ශ්‍රී ලංකාවේ දී දැකිය නොහැකිය. (...............)

(15) නිල් සහ රතු වර්ණය සමානව මිශ්‍රකොට චිත්‍ර ඇඳීමසඳහා අවශ්‍ය වන දම් පැහැති වර්ණය ලබාගත හැකිය. (...............)

I **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා A කොටසට ගැළපෙන නිවැරදි වචනය B කොටසින් තෝරා ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

| | A කොටස | | B කොටස |
|---|---|---|---|
| (16) | මැටි මාධ්‍යය | ................................................... | නෙළීම |
| (17) | සීල් මුද්‍රණය | ................................................... | ඇඹීම |
| (18) | කතුර | ................................................... | නත්තල හා සම්බන්ධයි |
| (19) | කැරොල් | ................................................... | යමක් අවශ්‍ය ආකාරයට කැපීමට |
| (20) | කළුගල් මාධ්‍ය | ................................................... | ග්‍රැපික් නිර්මාණ සඳහා |

ලකුණු 1 බැගින් 20කි. (20 5 2 = 40)

## II කොටස

**I පහත දැක්වෙන මාතෘකා අතරින් එක් මාතෘකාවක් තෝරාගෙන එක් චිත්‍රයක් පමණක් ඇඳ වර්ණ කරන්න.**

(1) අපේ පාසල හා පාසල් වත්ත මා දකින හැටි
(පරිසරය, ගොඩනැගිලි, ක්‍රීඩා කරන සිසුන්, වැඩෙහි යෙදී සිටින සිසුන් ගුරුවරුන් ආදිය ඇතුළත් කරන්න.)

(2) ගමේ පන්සලේ ආගමික වතාවත් වල යෙදෙන උපාසක උපාසිකා/දහම් පාසල් දරුවන්/වැඩිහිටි අය ඇතුළත් කර චිත්‍රයක් අඳින්න.

(3) කැලෑවක (වනයක) සැරිසරන වන සතුන් චිත්‍රයට නඟන්න.
(සතුන්ගේ විවිධ ඉරියව්, විවිධ සතුන් බිම සිටින හා ගස් උඩ සිටින සතුන් විශාල හා කුඩා ගස් ද යොදාගන්න.)

(4) තෑගි දවටනයක් සඳහා වර්ණ තුනක් භාවිතයෙන් ටෙම්ප්ලේට් ක්‍රමයට මෝස්තරයක් නිර්මාණය කරන්න. (කඩදාසි අච්චුවක පැස්ටල් අතුල්ලා ඇඟිල්ලෙන් මැදීම ටෙම්ප්ලේට් ක්‍රමය වේ.)

(5) මල් සහ ශාක පත්‍ර, භාවිතයට ගනිමින් චීත්ත රෙද්දකට ගැළපෙන ව්‍යාප්ත මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න.

(6) ක්‍රීඩා උත්සවයක් සඳහා ආරාධනා පත්‍රයක මුල් පිටුව සැලසුම් කර වර්ණ කරන්න. (ප්‍රමාණය අඟල් 8 5 6 පමණ ගන්න.
(ලකුණු 60)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 6 - 2019

### චිත්‍ර කලාව - පිළිතුරු පත්‍රය

**I කොටස**

(1) ක්‍රිස්තු දේවස්ථානයක බිම් සැලැස්ම

(2) බයිබලය කියවන ස්ථානය

(3) අල්තාරය හෙවත් පූජාසනය

(4) ගොතික් ක්‍රමයේ දේවස්ථාන

(5) රංජිත වීදුරු

(6) හැඩතල

(7) හර්මිකාව

(8) දියසායම්

(9) වකදෙක

(10) කොලාජ්

(11) 5

(12) 3

(13) 3

(14) 5

(15) 3

(16) ඇඹීම

(17) ග්‍රැපික්

(18) යමක් කැපීමට (අවශ්‍ය ආකාරයට)

(19) නත්තල් හා සම්බන්ධයි

(20) නෙළීම

(ලකුණු 1 5 20 = ලකුණු 20කි)